# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1899/13 - 2015 ජනවාරි මස 28 වැනි බදාදා - 2015.01.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල
පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත
(262 වන අධිකාරය වූ)
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ
ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාවේ
උපසභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

උපසභාපති, සභාපති ධූරයට පත්වීම හේතු කොට ගෙන ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාවේ උපසභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65 අ (1) වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන සෙබස්ති පේදුරු අරුලප්පු අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා මරියසෙබස්රියාම්පිල්ලෙයි අමලඩොරින් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී පොන්නුතුරෙයි කුගනාදන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මරියසෙබස්රියාම්පිල්ලෙයි අමලඩොරින් මහතා ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. කුගනාදන්,
තේරීම් භාර නිලධාරී,
ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 27 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

02 - 312

1A - G 20930 — 30 (2015/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

පූනාකරි ප්‍රාදේශීය සභාව

පූනාකරි ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන පොන්නම්පලම් සිරිස්කන්තරාසා මහතා ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ සභික ධූරය ඔහු විසින් අත හැර ඇති බව පූනාකරි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී පොන්නුතුරෙයි කුගනාදන් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

පී. කුගනාදන්,
තේරීම් භාර නිලධාරී,
පූනාකරි ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 26 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

02 - 313

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.